**ශීර්ෂය-161 වනජීවී සහ වන සංරක්ෂණ අමාත්‍යාංශය**

------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

වනජීවී සහ වන සංරක්ෂණ අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වනජීවී සහ වන සංරක්ෂණ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වනජීවී සහ වන සංරක්ෂණ අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික

විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු  නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) පුනරාවර්තන වියදම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් රු.136,077,087 ක් වුවද විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව එම මුදල් ප්‍රවාහය රු.173,151,502 ක් වූයෙන් රු.37,074,415 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම රු.136,077,087 ක් වන අතර එය පැහැදිලිව 2021 දෙසැම්බර් 31 දිනට පිළියෙළ කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල මුදල් ප්‍රවාහයන් නිවැරදිව හඳුනාගත යුතුය. |

#### (ආ) මූලධන වියදම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන වෙනුවෙන් රු.2,797,481 ක් වියදම් කර තිබූ නමුත් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව එම මුදල් ප්‍රවාහය රු.39,871,896 ක් වූයෙන් රු.37,074,415 ක වෙනසක් නිරීක්ෂණය විය. | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට අනුව ප්‍රාග්ධන වියදම් වර්ගීකරණයක් දක්වා ඇති නමුත්, මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කළ යුතු ආකෘතියේ ආයතනය විසින් මුදලින් සිදු කරන ලද සියලුම ප්‍රාග්ධන වියදම්, ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු අතර ඒ අනුව රු.39,871,896 ක් වූ ප්‍රාග්ධන වියදම දක්වා ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල මුදල් ප්‍රවාහයන් නිවැරදිව හඳුනාගත යුතුය. |

(ඇ) තැන්පතු
-----------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පිළියෙල කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ තැන්පතු ලැබීම් හා තැන්පතු ගෙවීම් මුදල් ප්‍රවාහයන් අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද ඒකාබද්ධ ශේෂ පිරික්සුමේ ඊට අනුරූප ශේෂයන් සමඟ සැසඳීමේදී රු.30,350 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම ලැබීම් හා ගෙවීම් අතපසුවීමකින් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ තැන්පතු ලැබීම් හා ගෙවීම් ලෙස සටහන් තැබීම මගහැරී ඇත. මෙය සමස්ත මූල්‍ය ප්‍රකාශයට බලපෑමක් සිදු නොවන අතර මෙවැනි මගහැරීම් ඉදිරියේ දී සිදු නොකරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති බව දන්වමි. | 2021/03 දරන රාජ්‍ය ගිණුම් විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

(ඈ) අත්තිකාරම් ගිණුම් ශේෂ
-----------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තා කරන ආයතනය විසින් අත්තිකාරම් බී ගිණුමට කරන ලද රු.225,829 ක් වූ හර කිරීම එලෙස නොදක්වා අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් කරන ලද බැර කිරීම්වලින් අඩු කර දක්වා තිබුණි. | මෙම රු.225,829 ක අගය නොවැම්බර් මස අත්තිකාරම් බී ගිණුම සඳහා නිලධාරීන්ගේ වැටුප්වලින් අය කරන ලද ලැබීම් මුදල වේ. එම අගය වැරදීමකින් වෙනත් අමාත්‍යාංශයක වැය ශීර්ෂයකට බැරකිරීමක් සිදු කර ඇති අතර එය දෙසැම්බර් මස අදාළ අමාත්‍යාංශ වැය විෂයක් හර කර නිවැරදි කිරීම සිදු කරන ලද බව දන්වමි. | මූල්‍ය ප්‍රකාශන තුල ගනුදෙනු විධිමත් පරිදි ඉදිරිපත් කල යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වුවද අමාත්‍යාංශය විසින් 2021 වර්ෂය සඳහා පිළියෙල කළ ඇස්තමේන්තුවේ වැය විෂයන් 10 ක සියයට 18 සිට සියයට 100 දක්වා පරාසයක ඉතිරිවීම් නිරීක්ෂණය විය. | 2021 අගෝස්තු 31 අමාත්‍ය මණ්ඩල තීරණය, කොවිඩ් වසංගත තත්ත්වය, රියදුරන් සහ නිලධාරීන් අමාත්‍යාංශයේ පිටතට ස්ථාන මාරු වීම වැනි හේතු නිසා මෙම ඉතිරිවීම් ඇති වූ බව දන්වමි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිසි සැලසුමකින් හා කළමනාකාරිත්වයකින් යුතුව ඇස්තමේන්තු සකස් කිරීමට පියවර ගත යුතුය. |

**2.2 විදේශ ආධාර ව්‍යාපෘති**

ශ්‍රී ලංකාවේ පරිසර පද්ධතිවල කළමනාකරණ හා වැඩි දියුණු කිරීම තුළින් එම පරිසර පද්ධති සංරක්ෂණය කිරීම හරහා ජනතාවට ප්‍රතිලාභ ලබාදීමේ අරමුණින්, පරිසර පද්ධති සංරක්ෂණය හා කළමනාකරණය (Eco System Conservation & Management) ව්‍යාපෘතිය අමාත්‍යාංශය යටතේ 2017 වර්ෂයේ ආරම්භ කර තිබුණි. මෙම ව්‍යාපෘතිය ඇමරිකානු ඩොලර් මිලියන 45 ක ලෝක බැංකු ණය ආධාර මත 2021 වර්ෂය තෙක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු අතර පසුව එය ඇමරිකානු ඩොලර් මිලියන 35 ක් සඳහා සැලසුම් අනුමත වී තිබුණි. මෙම ව්‍යාපෘතිය සැලසුම් කිරීම සහ කාර්ය සාධනය පිළිබඳ පහත කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය ප්‍රකාරව වර්ෂ 03 ක් සඳහා අමාත්‍යාංශ ලේකම් අනුමත කළ ප්‍රධාන ප්‍රසම්පාදන සැලසුමකට අනුව ණය මුදල් පූර්ණව උපයෝජනය වන අයුරින් විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතුය. මෙම ව්‍යාපෘතිය සඳහා මූලික ණය මුදල වූ ඇ.ඩො.මිලියන 45 සඳහා හෝ පසුව සංශෝධනය කළ ණය | ව්‍යාපෘතිය ආරම්භ කර ඇත්තේ නිශ්චිත අරමුණු සඳහා වන බැවින් ඒ සඳහා ප්‍රසම්පාදන කටයුතු සැලසුම් කර ඇති අතර අයිතමයන් සඳහා ලෝක බැංකු ණය මුදල අනුමත වී ඇත. එය පදනම් කර අවශ්‍ය සංශෝධනයන් සහිත ව වාර්ෂික ව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර අනුමැතිය ලබා දී ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මුදල වන ඇ.ඩො.මිලියන 35 සඳහා එවැනි සැලසුමක් පිළියෙල කර නොතිබුණි. | | |
| (ආ) | 2019 මාර්තු 15 දිනැති හා අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9 ඡේදය සහ ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතේ 2.1.1 ඡේදය ප්‍රකාරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කමිටුවක් (Project Steering Committee) පිහිටුවිය යුතු ය. සම්බන්ධිත ආයතන සඳහා ප්‍රතිපත්ති මාර්ගෝපදේශයන් සැපයීම හා එක් එක් ආයතනවල ව්‍යාපෘති ක්‍රියාකාරීත්වය අධීක්ෂණය කිරීම මෙම කමිටුවේ කාර්යයන් වන අතර, අවම වශයෙන් කාර්තුවකට එක් වරක්වත් රැස් වී ව්‍යාපෘතියේ ප්‍රගතිය සමාලෝචනය කළ යුතු වුවද 2016 වර්ෂයේ සිට 2021 නොවැම්බර් මස දක්වා අදාළ කමිටුව රැස්ව තිබුණේ වාර 06 ක් පමණි. තවද ඉහත චක්‍රලේඛය පරිදි භාණ්ඩාගාර ලේකම් විසින් නම් කරනු ලැබූ නියෝජිතයෙකු මෙම කමිටුවට ඇතුළත් විය යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවක සභාපතීත්වය දැරිය යුතු අමාත්‍යාංශ ලේකම් තනතුර 2020 – 2021 වර්ෂ 2 තුළ තුළ දී නිරන්තරයෙන් වෙනස්වීම, තනතුර අනුව පත්කර තිබූ අනෙකුත් නිලධාරීන් ද පත්කළ යුතු වීම හා කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ද ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව රැස්වීම දුෂ්කර වී ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) | වටිනාකම ඇ.ඩො. මිලියන 45 ක් වූ සංරචක 04 ක් වෙනුවෙන් විධිමත් ප්‍රතිපාදන පරිදි වෙන්කර තිබූ මෙම ව්‍යාපෘතිය සඳහා පසුව ඇ.ඩො. මිලියන 35 ක් දක්වා ප්‍රතිපාදන අඩු කර නැවත සැලසුම් වෙනස් කිරීමේදී පරිසර සංරක්ෂණය සඳහා අතිශය වැදගත් වන ව්‍යාපෘති සංරචක සඳහා ප්‍රතිපාදන එකතුව මුල් සැලැස්මට සාපේක්ෂව සියයට 38 කින් අඩු කර ආයතන කුසලතාවය හා ආයෝජන ධාරිතාව වැඩිකිරීම සඳහා වන සංරචකය සඳහා වන ප්‍රතිපාදන | වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 45.0 වන ප්‍රතිපාදනය, ඇ.ඩො. මිලියන 35.0 දක්වා අඩුවීම සිදු වන්නේ ව්‍යාපෘතියේ හෝ ලෝක බැංකුවේ අවශ්‍යතාව නිසා නොව කොවිඩ් 19 වසංගත තත්ත්වය හා අවම යැපුම් මට්ටමක සිටින ජන කොටස්වල ජීවන මට්ටම පවත්වා ගෙන යාම සඳහා හදිසි මුදල් අවශ්‍යතාවක් ලෙස ලෝක බැංකු ව්‍යාපෘති ගණනාවකින් මුදල් ලබා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයේ ලේකම් විසින් | සැලසුම් සකස් කිරීමේදී පරිසර සංරක්ෂණය සඳහා වැදගත් වන සංරචක සඳහා මූලිකත්වය ලබා දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඇ.ඩො. මිලියන 6.6 සිට 17.88 දක්වා එනම් ව්‍යාපෘති වටිනාකමෙන් අර්ධයකට වඩා වැඩි ප්‍රමාණයක් වන සමස්ත ප්‍රතිපාදනයෙන් සියයට 51 ක් දක්වා සියයට 36 කින් ප්‍රතිපාදන වැඩි කර තිබුණි. මෙමඟින් ව්‍යාපෘති හරයන්ට සිදුවන බලපෑම පිළිබඳව ඇගයීමක් සිදුකර Project Steering Committee මඟින් නිර්දේශ ලබා ගැනීමකින් තොරව මෙලෙස සංරචක අතර ප්‍රතිපාදන මාරු කිරීම සිදු කර තිබුණි. ඒ අනුව මූලික ව්‍යාපෘති අරමුණ වන පරිසර පද්ධතිවල කළමණාකරණය වැඩි කිරීම තුළින් එම පරිසර පද්ධති සංරක්ෂණය කර එමඟින් ජනතාවට ප්‍රතිලාභ ලබාදීම අත්පත් කර ගැනීම යන ප්‍රධාන අරමුණ ඉටුකර ගැනීමට නොහැකි වන බව නිරීක්ෂණය විය. | ලෝක බැංකුව වෙත කරන ලද ඉල්ලීමක ප්‍රතිඵලයක් වශයෙනි.<br>ඒ අනුව හඳුනා ගෙන තිබූ ක්‍රියාකාරකම් 60 ක් පමණ අවලංගු කිරීමට සිදු වූ අතර එම අවස්ථාව වන විට ආරම්භ කර තිබූ නුවර එළිය ශ්‍රී ලංකා වන විද්‍යා ආයතනය හා ගිරිතලේ ජාතික වනජීවී පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සම්බන්ධ ඉදිකිරීම් අඛණ්ඩ ව ක්‍රියාත්මක කළ යුතු නිසා ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර තබා ගැනීම අවශ්‍ය විය. ඒ අනුව කුසලතාව හා අයෝජන ධාරිතාව වැඩි කිරීම සඳහා වූ සංරචකය සඳහා අදාළ ප්‍රතිපාදන ඇ.ඩො.මි. 6.6 සිට 17.88 දක්වා ඉහළ ගොස් ඇත. | |
| (ඇ) | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන වටිනාකම රු.මිලියන 1,311 ක් වූ ව්‍යාපෘති 75 ක් අතරින් වටිනාකම රු.මිලියන 671 ක් වූ ව්‍යාපෘති 35 ක භෞතික ප්‍රගතිය සියයට 50 ක් හෝ ඊට අඩු මට්ටමක පවතින අතර විගණිත දිනය වන විට වටිනාකම රු.මිලියන 22 ක් වූ ව්‍යාපෘති 07 ක් අවලංගු කර තිබුණි. | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක බොහෝ ව්‍යාපෘති මේ වන විට අවසන් කර ඇති අතර ඉතිරි ව්‍යාපෘති සියයට 75 ට වැඩි භෞතික ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත.<br>අවලංගු කළ ව්‍යාපෘති සඳහා හේතු වී ඇත්තේ ප්‍රතිලාභී ජනතාව අදාළ ව්‍යාපෘති සඳහා අකමැත්ත ප්‍රකාශ කිරීම, ව්‍යාපෘති මුල් ඇස්තමේන්තු වැඩිවීම, ව්‍යාපෘති කාලය තුළ සම්පූර්ණ කළ නොහැකි වීම හා ඇන්තූරියම් වගා පුහුණු වැනි ව්‍යාපෘති සඳහා ප්‍රතිලාභීන් ඉතා කුඩා සංඛ්‍යාවක් සිටීම නිසා ජනතා විරෝධය වැනි කරුණු ය. | සැලසුම්වලට අනුකූලව ඉලක්ක ගත කාර්යයන් සම්පූර්ණ කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන වටිනාකම රු.මිලියන 878.76 ක් වූ ව්‍යාපෘති 273 ක් අතුරින් රු.මිලියන 433.6 ක් වූ ව්‍යාපෘති 106 ක භෞතික ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු අගයක පවතින අතර වටිනාකම රු.මිලියන 12.07 ක් වූ ව්‍යාපෘති 05 ක් අවලංගු කිරීමද අදාල කාලය තුල සිදු වී තිබුණි. | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම් හි මේ වන විට කුඩව සංචරක මධ්‍යස්ථානයේ හා ඉළුක්කුඹුර නේවාසිකාගාරයේ පමණක් සියයට 40 ක ප්‍රගතියක් පෙන්වන අතර අනෙකුත් සියළුම ක්‍රියාකාරකම් හි සියයට 50 කට වැඩි වූ ප්‍රගතියක් පෙන්වා ඇත. | - එම - |
| (ඊ) | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් ක්‍රියාත්මක වන වටිනාකම රු.මිලියන 2,598 ක් වූ ව්‍යාපෘති 34 ක් අතරින් ව්‍යාපෘති 28 ක භෞතික ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය | මේ වන විට එම ව්‍යාපෘති 34 න් 05 ක පමණක් භෞතික ප්‍රගතිය සියයට 50 ට අඩු තත්ත්වයේ පවතින අතර අනෙකුත් සියලු ව්‍යාපෘති සියයට 50 ට වඩා ඉහළ භෞතික ප්‍රගතියක් අත්පත් කර ගෙන ඇත. සියයට 50 ට අඩු ප්‍රගතියක් නොවන ව්‍යාපෘති සියල්ල ඉදිකිරීම් වන අතර ඉදිරියේ දී එම ව්‍යාපෘති සම්පූර්ණ කිරීමට කටයුතු කරමින් පවතී. | - එම - |
| (උ) | අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගම්මාන 13 ක විදුලිවැට ඉදි කිරීම සඳහා හඳුනා ගෙන තිබුණද ගම්මාන තුනක් වෙනුවෙන් විදුලි වැට ඉදි කිරීම සම්බන්ධ කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. එසේම වැටවල් තුනක් සඳහා පමණක් උපකරණ ලබා ගෙන තිබුණු අතර ඒ අතරින්ද එක් විදුලි වැටක ඉදි කිරීම් පමණක් අවසන් කර තිබුණි. එසේම කුරුණෑගල දිස්ත්‍රික්කයේ හඳුනාගත් ප්‍රදේශ 25 ක් අතරින් ගම්මාන 15 ක් සඳහා සියළු විදුලි වැට උපකරණ මිලදී ගෙන තිබියදීත් 2022 අප්‍රේල් මස වන විටත් විදුලි වැට 10 ක පමණක් ඉදි කිරීම් කටයුතු අවසන් කර තිබුණි. | අනුරාධපුර දිස්ත්‍රික්කයේ විදුලිවැට ඉදිකිරීම අවසන් කර තිබූ අතර නව විදුලි වැට 5 ක ඉදිකිරීම් සිදු කරමින් පැවතුණි. පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හා රාජ්‍ය දැව සංස්ථාවේ දැව කණු ලබාගැනීමේ ප්‍රමාදය ද ඇතැම් ගම්වැසියන් එකඟ වූ පරිදි මූල්‍ය හා ශ්‍රම දායකත්වය ලබා දීමට අකමැතිවීම මෙම ප්‍රමාදයට හේතු විය. | - එම -. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | යාල ජාතික උද්‍යානයේ වැව් හා කාර්ය මණ්ඩල අවශ්‍යතා සඳහා ජලය සැපයීමට ඉදි කරන කිලෝමීටර් 18 ක දිගින් යුත් පීවීසී නළ පද්ධතිය ඉදි කිරීම් කටයුතු 2019 වර්ෂයේදී ආරම්භ කිරීමට සැලසුම් කර තිබූ නමුත් එම වර්ෂයේදී සිදු නොකිරීම හේතුවෙන් 2021 වර්ෂයේදී කිලෝමීටරයක් සඳහා පිරිවැය රු.1,438,759 කින් වැඩි වී තිබුණු අතර ඒ අනුව එම කිලෝමීටර් 9 සඳහා රු.12,948,831 ක අතිරේක වියදමක් රජයට දැරීමට සිදු වී තිබුණි. | ටෙන්ඩර්කරුවන් ඉදිරිපත් කර තිබූ අභියාචන නිසා ඇතිවූ ප්‍රමාදයන් හා ජාතික අයවැය චක්‍රලේඛ අංක 5/2020 මගින් ලබා දී තිබූ උපදෙස් පරිදි කටයුතු කිරීමට සිදුවීම නිසා සිදු වූ ප්‍රමාදය මේ සඳහා හේතු විය. | විදේශාධාර ව්‍යාපෘති සඳහා ලැබෙන ණය මුදල් කාර්යක්ෂමව උපයෝජනය කල යුතුය. |
| (එ) | උක්ත ජලනල ව්‍යාපෘතියේ ජලනල එලීම (අයිතම D1) වෙනුවෙන් බිල්පත් අංක 03 දක්වා සමුච්චිත ප්‍රමාණය ලෙස මීටර් 19,169 කට රු.29,137,062 ක මුදලක් ගෙවා තිබුණි. එසේ වුවද එම ගෙවීම් සිදු කිරීමේදී උක්ත ව්‍යාපෘතියේ ජලනල එලීම සාර්ථකව සිදු කර තිබේද යන්න පරීක්ෂා කිරීම උදෙසා SIDA/SCA/3/2 5.43 අනුව Hydraulic Pressure Test (පීඩන පරීක්ෂණ) සිදු කිරීම අනිවාර්ය වුවද, උක්ත ගෙවීම් සිදු කිරීමේදී පීඩන පරීක්ෂණ සහතික පරීක්ෂාවකින් තොරව මීටර් 11,123 ක ප්‍රමාණයකට එනම් රු.16,906,960 ක් ගෙවීම් කර තිබුණි | පීඩන පරීක්ෂණයකින් අනතුරු ව ගෙවීම් සිදු කර ඇත. | විදේශාධාර ව්‍යාපෘති යටතේ සිදු කරන ඉදිකිරීම් නියමිත ප්‍රමිතියට අනුකූලව සිදු කල යුතුය. |

**3. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අමාත්‍යාංශයේ පුරප්පාඩු තනතුරු 28 ක් වූ අතර ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 18 ක්, තෘතියික මට්ටමේ තනතුරු 01 ක්, ද්විතියික මට්ටමේ තනතුරු 08 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 01 ක් පැවතුණු අතර ප්‍රාථමික මට්ටමේ අතිරික්ත තනතුරු 01 ක් පැවතුණි. | සේවක බඳවා ගැනීම් සීමා කර ඇති බැවින් අදාළ පුරප්පාඩු පිරවීමේ කටයුතු ප්‍රමාද වී ඇති අතර පුරප්පාඩු සඳහා නිලධාරීන් අනුයුක්ත කර ගැනීම සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා ඇත. | පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුය. |